# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2361/03 – 2023 දෙසැම්බර් මස 04 වැනි සඳුදා – 2023.12.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/15/10/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ 2021.12.17 දිනැති හා අංක 2258/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිළියන්දල, මාම්පේ, පී.එස්.පෙරේරා මාවත, අංක 103 හි පිහිටි ලංකා ආරක්ෂක සේවා සංගමය සහ කොළඹ 10, ටී.බී ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A 72/2021 හා 2023.10.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 40917 – 15 (2023/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

*නඩු අංකය:* A/72/2021.

ආරාවුල් අංක : IR/15/10/2010.

ලංකා ආරක්ෂක සේවා සංගමය,
අංක. 103, පී.එස්.පෙරේරා මාවත,
මාම්පේ,
පිළියන්දල.

පළමු පාර්ශ්වය

එදිරිව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී.බී.ජයා මාවත,
කොළඹ-10.

දෙවන පාර්ශ්වය

පෙනී සිටීම

පළමු පාර්ශ්වය වෙනුවෙන් - ඩබ්.එම්.ඩී. විජේවික්‍රම මහතා
දෙවන පාර්ශ්වය වෙනුවෙන් - නිතීඥ ප්‍රසංගා අයිලප්පෙරුම- නීති නිලධාරි,
නිතීඥ දිල්හානි රත්නායක මිය.

කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

එකී ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයාගේ යොමුවේ සඳහන් පරිදි ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වනුයේ,

I ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරක්ෂක අංශ සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ දී පුරප්පාඩු පිරවීමේ දී පිටතින් සේවකයින් බඳවා ගැනීම තුළ සුදුසුකම් ලත් ආයතනයේ සේවකයින්ට අවස්ථාවක් නොලැබීමෙන් අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමි විය යුතු ද යන්න

II ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන් විශාල පිරිසක් සඳහා උසස් වීම් නොලැබීම හා සුදුසුකම් සපුරා ඇතත් උසස් වීම් නොලබා ඔවුන් සිටි ශ්‍රේණියේම විශ්‍රාම යාමට සිදු වීම නිසා අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න හා එසේ වී නම් ඔවුන්ට කුමන සහන හිමි විය යුතු ද යන්න

III සමහර ආරක්ෂක නිලධාරීන්ට පිළිගත් උසස් වීම් ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් උසස් වීම් ලබා දීම හේතුවෙන් සුදුසුකම් සහිත සෙසු ආරක්ෂක නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න? සහ එසේ වීමනම් ඔවුන්ට කුමන සහන හිමි විය යුතු ද යන්න

IV සුදුසුකම් සපුරා ඇති ආරක්ෂක නිලධාරීන්ට විශ්‍රාම යාමට පෙර ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි උසස් වීම් ලබා නොදීම නිසා අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න සහ එසේ වී නම් ඔවුන්ට කුමන සහන හිමි විය යුතු ද?

යන්න පිළිබඳව වේ.

මෙම ආරාවුල කම්කරු, දෙපාර්තමේන්තුවට යොමු කර ඇත්තේ 2012 වර්ෂයේ මුල් භාගයේ දී වන අතර එයට කොළඹ කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේ දී 2012.08.03 දිනය යොදා ඇත. එබැවින් මීට පෙර 2023.01.01 දින සිට 2020.02.12 දින දක්වා කලින් පත් කර ඇති බේරුම්කරු ටී. පියසෝම මහතා විසින් මෙම නඩුවේ පැමිණිල්ල හා සාක්ෂි විමසා හරස් ප්‍රශ්න කිරීම් සහ නැවත ප්‍රශ්න කිරීම් මඟින් දීර්ඝ ලෙස බේරුම්කරණ විභාග පටිපාටිය ක්‍රියාත්මක කර ඇත.

එම කාලවකවානුව තුළ බොහෝ අවස්ථාවලදී දෙවන පාර්ශ්වය හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කළමණාකාරීත්වය විසින් මෙම පරීක්ෂණය සඳහා නම් කොට තිබූ සමහර නිලධාරිනියන් බේරුම්කරණය විසින් නියම කරන ලද පරීක්ෂණ දිනයන් ට පැමිණීම සැලසුම් කොට මගහැර ඇති බව ද මම නිරීක්ෂණය කරමි. ඉන් අනතුරුව 2020.12.10 වන දින එවකට කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් නීතිඥ ජේ.එම් කපිල ජයසේකර මහතා බේරුම්කරුවෙකු වශයෙන් පත් කර ඇති අතර කපිල ජයසේකර මහතා පරීක්ෂණ කටයුතු මාස කිහිපයක් පවත්වා ගෙන යාමෙන් පසුව සෞඛ්‍ය හේතූන් මත බේරුම්කාර තනතුරෙන් ඉවත් වී ඇත. ඉන් පසුව 2021 නොවැම්බර් 30 දිනැතිව එවකට කම්කරු අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් මා පත් කරන ලදුව මගේ පරීක්ෂණ කටයුතු මා ආරම්භ කරන ලද්දේ 2022.02.15 දින සිටය.

පෙනී සිටීම -

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ඩී.ජී කුලරත්න මහතා සමග දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරිනී ප්‍රසංගා අයිලප්පෙරුම මිය පෙනී සිටින ලදී.

මාගේ පරීක්ෂණ ක්‍රියාවලියේ දී.

01.දෙවන පාර්ශ්වයේ මෙම ආරාවුලට අදාළ වන බඳවා ගැනීමේ පටිපාටියක් ආයතනය සතුව තිබේ ද යන්න විමසන ලදි. එහි දී දෙවන පාර්ශ්වය ඒ පිළිබඳව ලිඛිත දේශනයක් ගොනු කිරීමට අවසර ඉල්ලා සිටි අතර මෙම ආරාවුල විසඳීමට සමථ යෝජනාවක් තිබේ ද යන්නත් විමසා සිටියෙමි. එම අවස්ථාවේ දී පැමිණිලිකාර පාර්ශ්වය විසින් සමථ යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නම් ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට සූදානම් බව දෙවන පාර්ශ්වය වන මහවැලි අධිකාරියේ නියෝජිතයින් ප්‍රකාශ කර සිටින ලදී. එහි දී සමථ යෝජනා ඉදිරිපත් කිරීමට සති දෙකක් කාලයක් ද දෙවන පාර්ශ්වය තවදුරටත් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට ඒ හා සමාන කාලයක් ලබා දුනිමි.

නැවත විභාගය පවත්වන ලද 2022.03.15 දින ද, 2022.06.30 දින ද කලින් කී සමථ යෝජනාවලිය ක්‍රියාත්මක කිරීමේ පියවර වලදී අවශ්‍ය සංශෝධනයන්ට ප්‍රතිපත්තිමය එකඟතාවයක් ලබා ගැනීමට ජාතික වැටුප් කොමිසමේ නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කළ බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු මඟින් බේරුම්කරණය වෙත වාර්තා කෙරිණි.

ඉන් පසුව 2022.07.28 දින දී ජාතික වැටුප් කොමිසම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ/නිගමන කඩිනම් කොට ලබා ගැනීමටත් වගඋත්තරකාර ආයතනයේ ප්‍රධානියා වන අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා පවත්වා තීරණයක් ගැනීමට මා විසින් නියම කළෙමි.

ඒ අතර සමථ පිළිබඳව දෙපාර්ශ්වය කටයුතු කිරීමට බේරුම්කරණය විසින් ප්‍රමාණවත් කාල සීමාවක් දෙන ලද අතර නැවත 2023.01.20 දින කැඳවන ලද අවස්ථාවේ දී මහවැලි අධිකාරියට අදාළ විෂය භාර කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්තුමා සමඟ තවදුරටත් සාකච්ඡා කර විධිමත් තීරණයක් ඉදිරියේ දී ලබා දීමට ප්‍රමාණවත් කාලයක් මහවැලි අධිකාරියේ නියෝජිතයින් විසින් ඉල්ලා සිටින ලදී.

ඉන් පසුව දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මෝසමක් මඟින් කරුණු ඉදිරිපත් කරමින් කියා සිටියේ මේ පිළිබඳව තීරණය තම ආයතනය විෂය පථය භාර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කිරීමට නියමිත විධිමත් කමිටුවක් මඟින් තීරණයක් ලබා ගත යුතු බව අමාත්‍යාශයේ ලේකම්වරයා ප්‍රකාශ කළ බවයි. ඉන් පසුව මහවැලි අධිකාරියේ විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත් කරන ලද කමිටුවේ තීරණය ලිඛිතව පහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත.

“එනම්, සහකාර ආරක්ෂක සුපරීක්ෂක II ශ්‍රේණියේ තනතුරු සඳහා 2007.10.06 වැනි දින සිට 2012.12.31 වැනි දින දක්වා වාර්ෂිකව පවතින පුරප්පාඩු සංඛ්‍යාව හඳුනා ගෙන එම වර්ෂ වලට අදාළව පවතින පුරප්පාඩු පිරවීම සඳහා අදාළ දින වලට පැරණි බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, පත්වීම් බලධාරියා අනුමත කරන ක්‍රමවේදය යටතේ සුදුස්සන් තෝරා ගෙන උසස් වීම් ලබා දීමටත්, එම නිලධාරීන් සඳහා හිඟ වැටුප් ගෙවීමකින් තොරව අදාළ වැටුප් තලයේ පිහිටුවීමටත් සුදුසු බව අනුමත කර ඇති බව ගරු බේරුම්කරණය වෙත කාරුණිකව වාර්තා කරමි.”

යනුවෙන් දෙවන පාර්ශ්වයේ යෝජනා වලිය බේරුම්කරණ වෙත ඉදිරිපත් කෙරුනි. ඉන් අනතුරුව පිළිවෙලින් 2023.05.03 දින ද. 2023.06.14 වන දින ද 2013.06.28 වන දින ද, බේරුම්කරණය විසින් තවදුරටත් පැහැදිලි කිරීම් වශයෙන් මෙකී පැමිණිල්ලේ ප්‍රධාන ඉල්ලීම සහ ඒ පිළිබඳව දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කළමනාකාරීත්වය සහ විෂය භාර අමාත්‍යාංශයේ

ලේකම්වරයාගේ එකඟවීම් සහ ප්‍රතික්ෂේප කිරීම් හා තවදුරටත් කරන ලද සැළකිරීම් වලට අවස්ථාව දෙන ලදි.

මෙම ඉදිරිපත් කිරීම් වලදී පැමිණිලිකාර පාර්ශ්වය එක හෙළාම ප්‍රකාශ කළේ දෙවන පාර්ශ්වය ඔවුනට අදාළ බඳවා ගැනීම් පටිපාටියේ නියමයක් නොවන ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වන ලද බවත් එහෙත් එම ප්‍රායෝගික පරීක්ෂණය අසමත් වූ අයටත් (සමත් විය යුතු ලකුණු සංඛ්‍යාවට අඩු ලකුණු ලබාගත්) ආයතනය විසින් අත්තනෝමතික ලෙස උසස් වීම් ලබා දී ඇති බවයි. මේ සඳහා පැමිණිලිකාර පාර්ශ්වය විසින් වගඋත්තරකාර ආයතනය මගින් අවිධිමත් ලෙස ලබා දී ඇති උසස් වීම් පිළිබඳව පිළිගත හැකි උදාහරණ කිහිපයක් ද ලබා දෙන ලදුව බේරුම්කරණය විසින් ඒ පිළිබඳව ලිඛිත සාක්ෂි අධ්‍යනය කිරීමෙන් අනතුරුව ආයතනය විසින් පැමිණිලිකරුවන් පවසන ආකාරයට අසාධාරණ ලෙස කටයුතු කර ඇති බව නිරීක්ෂණය කරමි.

එබැවින් මාගේ ප්‍රදානය ලෙස පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමි.

1. පැමිණිල්ලට අදාළ මහවැලි අධිකාරියේ ආරක්ෂක නියාමකවරුන් 129 දෙනා හට ඔවුන්ගේ පැමිණිල්ල බේරුකරණයේ ලියාපදිංචි වූ දින සිට ඔවුන් විශ්‍රාම ගිය දිනය දක්වා බලපැවැත්වෙන පරිදි එක් වැටුප් වර්ධකයක් ද, එම වැටුප් වර්ධකය, වගඋත්තරකාර ආයතනය විසින් බේරුම්කරණය වෙත ඉදිරිපත් කරන ලද අංක MASL/Adm/05/A72/2021 දරන 2023.09.23 දිනැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) ඩී.කේ.වී. විජයවර්ධන මහතා විසින් අත්සන් කරන ලද ලිපියේ ඇමුණුම් අංක 1 හි සඳහන් වන අන්දමට 2023.09.23 දිනැති අංක ඒ/72/2021 දරන බේරුම්කරණය විසින් නියමය පරිදි අනු අංක 4 ට අනුව නඩුවේ පාර්ශ්වකරුවන් අතරින් 2013.01.01 දිනට සේවයේ නියුතුව සිටි සේවකයින්ට ඔවුන් එකිනෙකාට අදාළ දිනයේ දී විශ්‍රාම යන දින තෙක් එක් වැටුප් වර්ධකයක් ලබා දීමේ පදනම මත කරන ලද ගණනය කිරීම් අනුව එක් එක් සේවකයාට අදාළ වන මුදල පහත සඳහන් වන පරිදි එක් එක් සේවකයා වෙත ගෙවීමටත් නියම කරමි.

| *අනු අංකය* | *සේවා අංකය* | *සේවකයාගේ නම* | *2023.01.01 වන දින වන විට සේවයේ යෙදී සිටීද යන වග* | *2013.01.01 දින දක්වා එකී වැටුප් වර්ධකයක් ගෙවීම මත හිමි වන මුදල* |
|---|---|---|---|---|
| 01. | 0153 | ඩබ්.ඒ.ආර්. තිලකරත්න | සේවයේ සිටි | රු. 45,443.55 |
| 02. | 0191 | එන්.එල්.කේ අප්පුහාමි | සේවයේ සිටි | රු. 48,537.10 |
| 03. | 0269 | එන්.එල්.එච්. සුමතිපාල | සේවයේ සිටි | රු. 47,690.32 |
| 04. | 273 | එන්.වී. විජේසූරිය | සේවයේ සිටි | රු. 51.246.77 |
| 05. | 0278 | කේ.ජී.ආර්.එන්.සේනාරත්න | සේවයේ සිටි | රු. 54,317.74 |
| 06. | 0340 | ඒ.එල්.චන්ද්‍රසිරි | සේවයේ සිටි | රු. 46,470.97 |
| 07. | 0345 | යූ.ඩී.සූරිආරච්චි | සේවයේ සිටි | රු. 47,929.35 |
| 08. | 0351 | එම්. වීරවංශ | සේවයේ සිටි | රු. 53,685.48 |
| 09. | 0389 | එස්.ජී. සීලවංශ | සේවයේ සිටි | රු. 49,417,74 |
| 10. | 0424 | එස්.කේ සිරිල් | සේවයේ සිටි | රු. 59,275.00 |
| 11. | 0589 | ඩබ්.එම්.ඩී. ලක්ෂ්මන් | සේවයේ සිටි | රු. 56,045.16 |
| 12. | 0732 | ආර්.එම්.පී.එස්. රත්නායක | සේවයේ සිටි | රු. 55,162.50 |
| 13. | 0748 | කේ.ජී.පී. නවරත්න | සේවයේ සිටි | රු. 47,588.33 |
| 14. | 0773 | එන්.ජී.ජී.පී. සිරිකුමාර | සේවයේ සිරි | රු. 61,413.33 |
| 15. | 0227 | එස්.ඩබ්. ගුණපාල | සේවයේ සිටි | රු. 92,070.97 |
| 16. | 0834 | ඒ.ඒ. අලහකෝන් බණ්ඩාර | සේවයේ සිටි | රු. 74,064.52 |
| 17. | 0307 | එම්.එල්.එම්. නිස්තාර් | සේවයේ සිටි | රු. 44,359,68 |
| 18. | 0370 | පී.එල්.පී.ආර්. පද්මසිරි | සේවයේ සිටි | රු. 44,100.00 |
| 19. | 0068 | ඒ.එස්.ටී. ගජනායක | සේවයේ සිටි | රු. 43,376.67 |
| 20. | 0156 | ඕ.කේ.කල්දේරා | සේවයේ සිටි | රු. 43,085.00 |
| 21. | 0257 | කේ.කේ.ජේ ද සිල්වා | සේවයේ සිටි | රු. 43,490.32 |
| 22. | 0414 | බී.එම්.ඒ.පී. බුලත්සිංහල | සේවයේ සිටි | රු. 42,210.00 |
| 23. | 0417 | කේ.ජී.එච්. පුණ්‍යසිරි | සේවයේ සිටි | රු. 43,808.33 |
| 24. | 0762 | ඩබ්.එම්. කරුණාරත්න | සේවයේ සිටි | රු. 42,045.16 |
| 25. | 0150 | ටී.කේ, සුසන්ත | සේවයේ සිටි | රු. 92,865.00 |
| 26. | 0355 | ඩී.ජේ. ප්‍රනාන්දු | සේවයේ සිටි | රු. 90,867.90 |
| 27. | 0742 | ඩී.ඩී.ජී. බණ්ඩාර | සේවයේ සිටි | රු. 42,733.87 |

| *අනු අංකය* | *සේවා අංකය* | *සේවකයාගේ නම* | *විශ්‍රාම ගිය දිනය* | *2013.01.01 දින දක්වා එක වැටුප් වර්ධකයක් ගෙවීම මත හිමි වන මුදල* |
|---|---|---|---|---|
| 01. | 0080 | බී.ජී. ජිනපාල | 2022.08.15 | රු. 40,425,00 |
| 02. | 0117 | ජේ.ජී.එන්. ධර්මසිරි | 2022.12.31 | රු. 42,000.00 |
| 03. | 0163 | ඊ.එම්.ඩබ්.ජී.එම්. සෙනවිරත්න | 2022.12.31 | රු. 42,000.00 |
| 04. | 0577 | කේ.පි. පුංචිබණ්ඩා | 2022.12.31 | රු. 42,000.00 |
| 05. | 0729 | ඩී.ඩබ්. ජයසිරි | 2022.05.26 | රු. 39,493.55 |
| 06. | 0740 | එච්.එම්.ඒ. හේරත් | 2022.12.31 | රු. 42,000.00 |
| 07. | 0745 | යූ.පී.ආර්.ජී. ජයසිංහ | 2022.12.01 | රු. 41,661.29 |
| 08. | 0010 | කේ.ඒ.ඩී. පුෂ්පරාණී | 2022,03,09 | රු. 38,601.61 |
| 09. | 0044 | ජේ.ඒ. ප්‍රේමරත්න | 2014.09.30 | රු. 3570.00 |
| 10. | 0055 | ඒ.එච්.එම්. විජේරත්න | 2019.06.13 | රු. 24,314.07 |
| 11. | 0056 | පී.ජී.එස්. සේනාධීර | 2015.02.22 | රු. 4383.57 |
| 12. | 0088 | එන්.කේ. ධර්මදාස | 2020.11.24 | රු. 33,180.00 |
| 13. | 0091 | ජේ.එම්. ආරියවර්ධන | 2016.07.12 | රු. 8731.74 |
| 14. | 0095 | ආර්.එම්. මුදියන්සේ | 2016.09.11 | රු. 9139.53 |
| 15. | 0102 | ඩබ්.ඒ.එස් ද සිල්වා | 2020.09.01 | රු. 32.211.67 |
| 16. | 0109 | වී.ජී. හීන්බණ්ඩා | 2018.11.29 | රු. 19,728.73 |
| 17. | 0130 | එස්.කේ.බී. අලහකෝන් | 2019.12.01 | රු. 26,072.13 |
| 18. | 0151 | එන්.කේ.යූ ස්වර්ණපාල | 2019.10.23 | රු. 25,666.97 |
| 19. | 0160 | බී.ජී. දයාරත්න | 2021.02.14 | රු. 34,125.00 |
| 20. | 0162 | එස්.ඒ. කුලරත්න | 2021.10.10 | රු. 36,862.90 |
| 21. | 0177 | පී.ජී. තිලකරත්න | 2020.12.31 | රු. 33,600.00 |
| 22. | 0213 | එම්. දසනායක | 2013.04.10 | රු. 566.67 |
| 23. | 0229 | එච්.ජී.යූ පියතිස්ස | 2020.11.25 | රු. 33,191.67 |
| 24. | 0238 | කේ.ජී. දයානන්ද | 2021.01.04 | රු. 33,645.16 |
| 25. | 0241 | බී.එච්. සිරිල් | 2017.10.03 | රු. 13,817.42 |
| 26. | 0243 | කේ.ජී. අබේරත්න | 2019.11.27 | රු. 26,030.60 |
| 27. | 0246 | එච්.එම්.යූ.ජී. කුමාරසේන | 2020.10.28 | රු. 32,866.13 |
| 28. | 0280 | ඊ.ඩී.ප්‍රේමරත්න | 2018.06.06 | රු. 18,125.60 |
| 29. | 0310 | එන්.පී. අබේරත්න | 2021.10.06 | රු.37,043.55 |
| 30. | 0313 | ටී.එම්.ජී.එස්. තොටගොඩවත්ත | 2017.01.22 | රු. 11,787.74 |
| 31. | 0317 | කේ.ඒ.ඒ. කොඩිකාර | 2020.11.01 | රු. 32,911.67 |
| 32. | 0318 | එස්. විජේසේකර | 2020.11.16 | රු. 33,086,67 |
| 33. | 0335 | ජී.ඒ.ටී. මහානාම | 2016.06.30 | රු. 8652.00 |
| 34. | 0334 | වයි.පී.කේ. ද සිල්වා | 2020.08.12 | රු. 31,985,48 |
| 35. | 0347 | එච්.එච්.එම්.ඒ. හේරත් | 2017.04.13 | රු. 17,634.47 |
| 36. | 0374 | පී.ආර් හේමචන්ද්‍ර | 2018.08.12 | රු. 18,733.61 |
| 37. | 0381 | එම්.ඩී. පේමචන්ද්‍ර | 2018.12.31 | රු. 22,608.00 |
| 38. | 097 | ඒ.කේ. හෙට්ටිආරච්චි | 2020.07.01 | රු. 31,737.10 |
| 39. | 0401 | කේ.ආර් සුගතපාල | 2020.02.07 | රු. 29,837.50 |
| 40. | 0410 | එන්.ඒ. දිසානායක | 2022.03.01 | රු. 38,511.29 |
| 41. | 0412 | කේ.ඒ. චිත්‍රකුමාර | 2019.10.13 | රු. 25,565.68 |
| 42. | 0413 | ආර්.ජේ. ලේනෝරා | 2017.12.23 | රු. 14,457.55 |
| 43. | 0419 | එච්.කේ. ප්‍රේමසිරි | 2021.08.21 | රු. 40,600,00 |
| 44. | 0423 | ආර්.ඩී. ගුණවර්ධන | 2018.04.15 | රු. 17,653.00 |
| 45. | 0427 . | බී.එම්.එස් අබේරත්න | 2016.02.19 | රු. 7761.79 |
| 46. | 0428 | ඩබ්.එම්. රත්නායක | (අදාළ නොවේ) | |
| 47. | 0430 | එස්.ඩබ්. සමරජීව | 2018.02.28 | රු. 17,236,00 |
| 48. | 0435 | එම්.ජී.පී මැදිවත්ත | 2021.04.17 | රු. 34,834,33 |
| 49. | 0448 | පී.ඒ.එස් ප්‍රේමසිරි | 2016.08.31 | රු. 9064.00 |

| *අනු අංකය* | *සේවා අංකය* | *සේවකයාගේ නම* | *විශ්‍රාම ගිය දිනය* | *2013.01.01 දින දක්වා එක වැටුප් වර්ධකයක් ගෙවීම මත හිමි වන මුදල* |
|---|---|---|---|---|
| 50. | 0450 | බී.ඩබ්. පද්මසිරි | 2021.12.30 | රු. 37,800.00 |
| 51. | 0452 | ආර්.ඒ.ජේ.එස්. රණසිංහ | 2021.11.02 | රු. 37,100.00 |
| 52. | 0463 | ඩී.එම්. සුගතපාල | 2021.09.01 | රු. 36,411.67 |
| 53. | 0496 | ඒ.වී.ප්‍රේමසිරි | 2018.11.06 | රු. 19,515.60 |
| 54. | 0564 | ඒ.එම්.එන් ප්‍රේමතිලක | 2018.03.23 | රු. 17,442.26 |
| 55. | 0512 | ඩබ්.එම්.ඩී විජේවික්‍රම | 2018.10.31 | රු. 19,460.00 |
| 56. | 0541 | ඒ. හර්මන් සිල්වා | 2015.05.15 | රු. 4842.26 |
| 57. | 0561 | එන්. හපුගොඩ | 2017.02.09 | රු. 11,935.79 |
| 58. | 0574 | ඩබ්.එම්.ඒ. බණ්ඩාර | 2020.08.18 | රු. 32,053.23 |
| 59. | 0575 | ඩබ්.ආර්.ඒ.එන්. රණසිංහ | 2021.10.27 | රු. 37.054.84 |
| 60. | 0581 | එච්.එම්.අයි. නන්දසේන | 2021.12.19 | රු. 37,664.52 |
| 61. | 0590 | එන්. බාලසූරිය | 2018.09.29 | රු. 19,172.73 |
| 62 | 0611 | එම්.එම්.ඩී. ද සිල්වා | 2021.05.20 | රු. 35.225.81 |
| 63 | 0666 | එච්.එම්. සමන් බණ්ඩාර | 2017.07.30 | රු. 13,302.19 |
| 64 | | | (මිය ගොස් | |
| 65 | | | ඇත) | |
| 66 | 0676 | ආර්. දිසානායක | 2016.06.15 | රු. 8549.00 |
| 67 | 0674 | ඒ.එම්.එන්. බණ්ඩාර | 2018.07.05 | රු. 18.114.84 |
| 68 | 0682 | එච්.ඩබ්.එස්. ඉන්ද්‍රසිරි | 2017.05.08 | රු. 12,646.45 |
| 69 | 0685 | යූ.වී. ජයසූරිය | 2020.11.12 | රු. 33,040.00 |
| 70 | 0692 | යූ.ආර්. අබේසිංහ | 2014.03.04 | රු. 2231.94 |
| 71 | 0722 | යූ.පී විජේතුංග | 2013.02.27 | රු. 333.93 |
| 72 | 0724 | ආර්.එම්.ජී.එන්. රාජගුරු | 2020.06.07 | රු. 31,231.67 |
| | 0725 | එච්.එස්. පෙරේරා | 2019.03.05 | රු. 22,972.65 |
| | 0741 | ඒ.එච්.කේ චන්ද්‍රසිරි | 2018.02.08 | රු. 16.759.43 |
| 73 | 0746 | ටී.වී පොඩි මහත්තයා | 2021.05.19 | රු. 35,214.52 |
| 74 | 0761 | වී.එම්.පී.කේ දිසානායක | අදාළ නොවේ | |
| 75 | 0108 | එම්.ඩී. ගුණදාස | 2017.11.01 | රු. 28,494.37 |
| 76 | 0358 | ටී.ඒ.ඒ.කේ.ඊ. ආරියරත්න | 2020.06.30 | රු. 63,900.00 |
| 77 | 0511 | ජී.කේ.උබයසිරිවංශ | 2020.10.15 | රු. 66,373.55 |
| 78 | 0752 | ජේ.ඒ.එස්. දයාරත්න | 2017.03.26 | රු. 21,047.23 |
| 79 | 0254 | ඊ.එම්.ජේ.ආර්.එල්.බී එදිරිසිංහ | 2017.11.22 | රු. 14,213.47 |
| 80 | 0436 | එච්.ඩී.සී. බාලසූරිය | 2015.03.30 | රු. 4584.52 |
| 81 | 0288 | පී.ජී. නවරත්න | 2014.11.01 | රු. 3575.67 |
| 82 | 0396 | එච්.එම් හේරත්බණ්ඩා | 2018.10.01 | රු. 19,190.97 |
| 83 | 0408 | ආර්.එම් හේරත්බණ්ඩා | 2014.01.01 | රු. 2045.48 |
| 84 | 0507 | ඩබ්.ටී.සී. පෙරේරා | 2019.12.13 | රු. 23,067,79 |
| 85 | 0520 | එච්.ඩබ්.ජී.එච්. සෝමසිරි | 2017.03.07 | රු. 12,154.65 |
| 86 | 0669 | එස්.එම්.එල්. සමරදිවාකර | 2018.04.14 | රු. 17,643.73 |
| 87 | 0743 | යූ. විජේසිංහ | 2018.06.20. | රු. 18,088.53 |
| 88 | 0101 | පී. ආර්.එස්.එස්. ද සිල්වා | 2016.09.09 | රු. 15,283,50 |

2. 2023.01.01 දිනය වන විට සක්‍රීය සේවයේ නියුතුව සිටින ආරක්ෂක නියාමකවරුන්ට ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ ඊළඟට අදාළ වන ශ්‍රේණියට උසස් වීම 2023.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ලබා දිය යුතු බවට නියම කරමි.

3. තව ද මෙම ප්‍රදානය වෙනත් ව්‍යස්ථාපිත දීමනා ලැබීමට බාධාවක් නොවන බව තීරණය කරමි.

| අනු අංකය | සේවක අංකය | සේවකයාගේ නම |
|---|---|---|
| 01 | 0153 | ඩබ්.ඒ.ආර්. තිලකරත්න |
| 02. | 0191 | එන්.එල්.කේ අප්පුහාමි |
| 03. | 0269 | එන්.එල්.එච්. සුමතිපාල |
| 04. | 273 | එන්.වී. විජේසූරිය |
| 05. | 0278 | කේ.ජී.ආර්.එන්. සේනාරත්න |
| 06. | 0340 | එ.එල්. චන්ද්‍රසිරි |
| 07. | 0345 | යූ.ඩී. සූරියආරච්චි |
| 08. | 0351 | එම්.වීරවංශ |
| 09. | 0389 | එස්.ජී. සීලවංශ |
| 10. | 0424 | එස්.කේ. සිරිල් |
| 11 | 0589 | ඩබ්.එම්.ඩී ලක්ෂ්මන් |
| 12. | 0732 | ආර්.එම්.පී.එස් රත්නායක |
| 13. | 0748 | කේ.ජී.පී. නවරත්න |
| 14. | 0773 | එන්.ජී.ජී.පී. සිරිකුමාර |
| 15. | 0227 | එස්.ඩබ්.ගුණපාල |
| 16. | 0834 | ඒ.ඒ. අලහකෝන් බණ්ඩාර |
| 17. | 0307 | එම්.එල්.එම්. නිස්තාර් |
| 18. | 0370 | පී.එල්.පි.ආර් පද්මසිරි |
| 19. | 0068 | ඒ.එස්.ටී. ගජනායක |
| 20. | 0156 | ඕ.ජේ. කල්දේරා |
| 21. | 0257 | කේ.කේ.ජේ. ද සිල්වා |
| 22. | 0414 | බී.එම්.ඒ.පී.බුලත්සිංහල |
| 23. | 0417 | කේ.ජී.එච්. පුණ්‍යසිරි |
| 24. | 0762 | ඩබ්.එම්. කරුණාරත්න |
| 25. | 0150 | ටී.කේ. සුසන්ත |
| 26. | 0355 | ඩී.ජී. ප්‍රනාන්දු |
| 27. | 0742 | ඩී.වී.ජී බණ්ඩාර |

4. 2023.01.01 වන දින වන විට සක්‍රීය සේවයේ යෙදී සිටි ඉහත නම් සඳහන් වන ආරක්ෂක නියාමකයින් හට ඔවුන් දැනට දරන ආරක්ෂක නියාමක තනතුරට අදාළ වන ඊළඟ උසස් වීම 2023.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි ලබා දිය යුතු බවට නියම කරමි.

තව ද එදින සිට ඔවුන්ට අදාළ වැටුප් තලයට අනුව 2023.01.01 දින සිට හිඟ වැටුප් ගෙවිය යුතු ය.

මෙම තීරණය *ගැසට් පත්‍රයේ* පළ කර ලිත් මාසයක් ඇතුලත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත රු.3.572,765.00 (තිස්පත් ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය හැට පහක්) මුදල තැන්පත් කළ යුතු බවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නියම කරයි. තව ද, 2023 ජනවාරි 01 වන දින වන විට සක්‍රීය සේවයේ යෙදී සිටි ආරක්ෂක නියාමකයින් හට ඔවුන් දරන ලද තනතුරට අදාල ඊලඟ උසස් වීම (සේවකයින් 27 දෙනාට අදාළ උසස් වීම්) ලබා දීම ලිත් මසක් ඇතුලත ක්‍රියාත්මක කර ඒ බව මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත වාර්තා කළ යුතු ය.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සඳහන් කරමි.

ආචාර්ය කේ.ඒ.එස්. කීරිගල,
බේරුම්කරු.

2023 ඔක්තෝබර් මස 13 වැනි දින.

EOG 12-0035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.